**ප්‍රධාන නීතිරීතිවල සාරාංශය***

**කෙටි කරුණු**

| **සැලසුමෙහි ලක්ෂණ** | | **වැඩි විස්තර සඳහා** |
|---|---|---|
| **යෝග්‍යතාව** | • **HSBC Premier සඳහා සුදුසුකම් ලැබීමට ශ්‍රීලංරු මිලියන 15ක මුළු සබඳතා ශේෂයක් (TRB)ඔබ විසින් පවත්වාගෙන යා යුතු වේ** | • **HSBC Premier** පිළිගැනීමේ පැකේජය<br>• බැංකුවේ ගාස්තු ලේඛනය |
| **ගිණුමෙහි ලක්ෂණ** | • එකම ගිණුම් අංකයක් යටතේ පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා රුපියල් (ශ්‍රීලංරු)/විදේශ ව්‍යවහාර මුදල් ඉතුරුම් ගිණුම් (FCY), කාල තැන්පතු ගිණුම්, ශ්‍රීලංරු ජංගම ගිණුම්, විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් (SIFDA) සංකලිත ගිණුම්වලට අඩංගු වේ<br>• HSBC Premier සහ HSBC හි ඔබ විසින් පවත්වාගෙන යනු ලබන අනෙකුත් ගිණුම් සඳහා වන ඔබේ සංකලිත ගිණුම යටතේ ඔබගේ මූල්‍ය ක්‍රියාකාරකම් සියල්ලම කැටි කළ ඒකාබද්ධ ප්‍රකාශනය<br>• HSBC Premier ATM කාඩ්පත/ඩෙබිට් කාඩ්පත, ක්‍රෙඩිට් කාඩ්පත සහ චෙක්පොත | |
| **ප්‍රතිලාභ** | **ඔබ සහ ඔබේ වත්කම්**<br>• ඔබටම කැප වූ Premier සබඳතා කළමනාකරු<br>**ඔබේ එදිනෙදා බැංකුකරණ කටයුතු**<br>• තැන්පතු, විදේශ ව්‍යවහාර මුදලින් කෙරෙන වෙළඳ ගනුදෙනු සහ ණයට දීම් සඳහා අනුග්‍රහපූර්වක පොලී අනුපාතිකයන් සහ නීතිරීති<br>• Premier මධ්‍යාස්ථාන වෙත සුවිශේෂී ප්‍රවේශය සහ සතියේ දින 7/පැය 24 පුරා HSBC Premier ඇමතුම් මධ්‍යස්ථාන, දුරකථන බැංකුකරණ සේවා සහ පුද්ගලික අන්තර්ජාල බැංකුකරණ සේවා | |

| | | |
|---|---|---|
| | • පූර්ව-අනුමැතිය සහිත HSBC Premier MasterCard ක්‍රෙඩිට් කාඩ්පත<br>**ඔබ සහ ඔබේ පවුල**<br>• ඔබට සහ ඔබේ මුළු පවුලටම ලොව ඕනෑම තැනක දී හදිසි අවස්ථාවක් ඇති වුවහොත් ලැබෙන සහය<br>• සුවිශේෂී HSBC Premier ළමා ඉතුරුම් ගිණුම් සඳහා දරුවන්ට නොමිලේ ATM කාඩ්පත / පිළිගැනීමේ කාඩ්පත්<br>**ලොව ඕනෑම තැනක දී ඔබේ බැංකුව**<br>• Premier In One, Premier In All – අමතර දේශීය TRB අවශ්‍යතාවන් සපුරාලීමක් නොමැතිව වෙනත් රටවල HSBC Premier හා සම්බන්ධවීමේ හැකියාව ඔබට ඇත<br>• Global View සහ Global Transfer හරහා ස්වයං-නාම ගිණුම් හුවමාරු නොමිලේ<br>• නොමිලේ[1] මුදල් ආපසු ගැනීම් HSBC සමූහයේ ATM ජාලය[2]<br>• හදිසියේ මුදල් කරගැනීමේ සේවා සහ ගෝලීය හදිසි ඇමතුම් සහය | |

මූල්‍ය

| | | |
|---|---|---|
| **ශේෂය අඩුවීමේ ගාස්තුව** | • **ඔබේ මුළු සබඳතා ශේෂය (TRB) ශ්‍රීලංරු මිලියන 15 ට අඩු වේ නම්, මාසික ගාස්තුව ශ්‍රී ලංරු. 7,500/-කි** | • බැංකුවේ ගාස්තු ලේඛනය<br>• එක් එක් සැලසුම සඳහා වන තොරතුරු පත්‍රය |
| **ක්‍රෙඩිට් කාඩ්පත් ගාස්තු** | • HSB Premier Master Card මූලික හා අතිරේක ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා වාර්ෂික ගාස්තු අය නොකෙරේ<br>• නැති වූ කාඩ්පත් නැවත නිකුත් කිරීමේ ගාස්තු අය නොකෙරේ | |
| **ATM මුදල් ආපසු ගැනීමේ ගාස්තු** | • ගාස්තුවක් අය නොකෙරෙන[1] HSBC සමූහයේ ATM ජාලය[2] භාවිතයෙන් HSBC Premier ATM කාඩ්පත, HSBC Premier MasterCard ක්‍රෙඩිට් කාඩ්පත මගින් ගනුදෙනු සිදු කළ හැක | |

| | | |
|---|---|---|
| **වෙනත් ගාස්තු** | • ගෝලීය මුදල් හුවමාරු සඳහා වන ගාස්තු සහ හදිසියේ මුදල් කරගැනීම් සේවා සඳහා වන ගාස්තු අය නොකෙරේ<br>• තෝරාගත් බැංකුකරණ සේවාවන් සඳහා ගාස්තු අය නොකිරීම් හා අනුග්‍රහපූර්වක පිරිනැමීම් රැසක්. ගාස්තු සහ අය කිරීම් පිළිබඳ විස්තර සඳහා කරුණාකර HSBC වෙබ් අඩවියෙන් හෝ වෙනත් ඕනෑම HSBC ශාඛාවක දී 'HSBC පාරිභෝගික බැංකුකරණ සහ වත්කම් කළමනාකරණ ගනුදෙනුකරුවන්' සඳහා වන HSBC බැංකුවේ ගාස්තු ලේඛනය බලන්න. | • HSBC වෙබ් අඩවිය |

**සටහන්:**

1. විදේශයක අදාළ රටෙහි බැංකු ගාස්තු අය කෙරෙනු ඇත (අදාළ වේ නම්).
2. ආර්ජන්ටීනාව, බ්‍රසීලය, ප්‍රංශය, ග්‍රීසිය, මෝල්ටාව, මැක්සිකෝව, නවසීලන්තය සහ ටර්කි යන රටවල ඇති HSBC ATM යන්ත්‍ර හැර, ලොව පුරා ඇති අනෙකුත් HSBC ATM යන්ත්‍රවලට UnionPay ATM chip card මඟින් ප්‍රවේශවීමේ හැකියාව ඇත.

## කෙටි විස්තරය

| | | වැඩි විස්තර සඳහා |
|---|---|---|
| **HSBC Premier සඳහා යෝග්‍යතාව** | • HSBC Premier සඳහා වන විශේෂ ලක්ෂණ සහ ප්‍රතිලාභ භුක්ති විඳීමට HSBC Premier සඳහා වන යෝග්‍යතා සුදුසුකම් සහ වෙනත් අදාළ නීතිරීති සහ කොන්දේසි ඔබ විසින් සපුරාලිය යුතු වේ | • සංකුලිත ගිණුම් සඳහා වන නීතිරීති සහ කොන්දේසි (“T&Cs”) |
| **විවිධ මට්ටම්** | • විවිධ ලක්ෂණ සහිත මට්ටම් අප විසින් සකස් කරනු ඇත<br>• ඔබගේ ඉල්ලීම මත හෝ අපගේ අභිමතය පරිදි ඔබ වෙනුවෙන් එක් මට්ටමක් අප විසින් වෙන් කරනු ඇත<br>• එවැනි මට්ටමක රඳා පැවතීම හෝ එකී මට්ටමට අදාළ ප්‍රතිලාභ භුක්ති විඳීම පිණිස ඔබ විසින් සපුරාලිය යුතු යෝග්‍යතා උපමානයන් නිශ්චය කිරීමේ හෝ වෙනස් කිරීමේ අයිතිය අප සතු ය | |

| | | |
|---|---|---|
| **හවුල් ගිණුම්** | • නීතිරීති සහ කොන්දේසි යටතේ අදාළ ගිණුම, සේවා හෝ අන් ආකාරයේ බැඳීම් හා වගකීම් සම්බන්ධයෙන් හවුල් ගිණුම් හිමියන් එකිනෙකා ද සමඟ හවුල්ව හා වෙන් වෙන් ව ඔබ සියලුදෙනාම බැඳී සිටියි | |
| **ගාස්තු** | • අදාළ අවස්ථාවන් හි දී කලින් කලට සේවා ගාස්තු, පහසුකම් ගාස්තු හෝ වෙනත් ගාස්තු පනවනු ඇත. ගාස්තු සහ අයකිරීමේ 'HSBC පාරිභෝගික සහ වත්කම් කළමනාකරණ ගනුදෙනුකරුවන් සඳහා වන බැංකුකරණ ගාස්තු ලේඛනය' හි ප්‍රකාශයට පත් කෙරෙන අතර, HSBC Premier වෙබ් අඩවියෙන් හෝ ඕනෑම HSBC ශාඛාවක් වෙතින් ද ලබාගත හැකිය | |
| **අයිරා ආරක්ෂණය** | • අප විසින් අයිරා ආරක්ෂණ ණය පහසුකමක් ("OD Protection") ඔබේ ශ්‍රී ලංකා රුපියල් ජංගම ගිණුමට ලබාදිය හැකිය. එකී "OD Protection" හි සීමාව සහ පොලී අනුපාතිකය සැකසීමේ හෝ වෙනස් කිරීමේ අයිතිය අප සතු වේ | |
| **ඔබේ තොරතුරු භාවිතය** | • HSBC හෝ HSBC සමූහයෙහි වෙනත් සාමාජිකයන් ගනුදෙනුකරුගේ තොරතුරු (ගනුදෙනුකරු, ගනුදෙනුකරුගේ ගනුදෙනු, ගනුදෙනුකරු විසින් HSBC හි සැලසුම් හා සේවාවන් භාවිතය සහ HSBC සමූහය සමඟ ගනුදෙනුකරුගේ සම්බන්ධය පිළිබඳ අදාළ තොරතුරු ද ඇතුළත්ව) එකතුකිරීම, භාවිත කිරීම හා හුවමාරු කරගැනීම සිදුකළ හැක. ගනුදෙනුකරු (හෝ ගනුදෙනුකරු වෙනුවට කටයුතු කරන අයෙකු) වෙතින්, නැතහොත් වෙනත් මූලාශ්‍රයකින් (පොදුවේ ලබාගත හැකි තොරතුරු ද ඇතුළත්ව) HSBC හෝ HSBC සමූහයේ වෙනත් සාමාජිකයෙකු වෙතින් ලබාගත හැකිව ඇති වෙනත් තොරතුරු සමඟ උත්පාදිත හෝ සම්බන්ධිතව HSBC විසින් හෝ HSBC සමූහයේ සාමාජිකයෙකු විසින් හෝ ඒ වෙනුවෙන් ගනුදෙනුකරුගේ තොරතුරු ඉල්ලා සිටිය හැකිය. | |

| | | |
|---|---|---|
| **ඔබේ ගිණුම්වලට හර කිරීමට; හිලව් කිරීමට අපට ඇති අයිතිය** | **ඔබ වෙත පූර්ව දැනුම්දීමකින් තොරව පහත සඳහන් කටයුතු සිදු කිරීමට අපට අයිතිය ඇත:**<br>• ඔබ විසින් අප වෙත ගෙවිය යුතුව ඇති ඕනෑම මුදලක්, අප සමග ඔබ විසින් පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමකින් හර කිරීමට<br>• ඔබ විසින් අප සමග පවත්වාගෙන යනු ලබන ඔබගේ කිසියම් හෝ සියලුම ගිණුම්වල ශේෂයන් රඳවාගැනීමට, සංයුක්ත කිරීමට, හෝ ඒකාබද්ධ කිරීමට සහ අප වෙත ගෙවීමට ඇති එවැනි ඕනෑම ගිණුමක් බැරට ඇති ඕනෑම මුදලක් සත්‍ය හෝ අහඹු වුවද, වර්තමාන හෝ අනාගත ඔබ විසින් ගෙවිය යුතුව ඇති වුවද, (සහ ඔබ විසින් තනිව හෝ වෙනත් ඕනෑම අයෙකු සමග හවුල් ව වුවත්) හිලව් කිරීමට සහ මාරුකිරීමට, සහ<br>• ඔබ වෙත අප විසින් ගෙවිය යුතුව ඇති මුදලට වඩා ඔබ විසින් අප වෙත ගෙවිය යුතුව ඇති කිසියම් මුදලක වටිනාකම වැඩි වූ අවස්ථාවක, අප සමග පවත්වාගෙන යන ඔබගේ කිසියම් හෝ ඕනෑම ගිණුමක ඕනෑම ව්‍යවහාර මුදල් වර්ගයකින් බැරට ඇති ඕනෑම මුදලක් ඔබ වෙත ගෙවිය යුතු හෝ ඔබ විසින් ඉල්ලා සිටි අවස්ථාවක දී ඔබ වෙත ආපසු ගෙවීම ප්‍රතික්ෂෙප කිරීමට | |
| **සැලසුමෙහි ලක්ෂණ** | | **වැඩි විස්තර සඳහා** |
| **සේවා හෝ ගිණුම් අවසන් කිරීම** | • පූර්ව ලිඛිත දැන්වීමක් මගින් අපගේ සේවාවන් හෝ ඔබේ ඕනෑම ගිණුමක් ඔබට අවසන් කළ හැකිය<br>• ඔබ වෙත සපයන අපගේ සේවාවන් සම්පූර්ණයෙන් හෝ එම සේවාවන්ගෙන් ඕනෑම කොටසක් කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව අත්හිටුවීම හෝ නීතිරීති සහ කොන්දේසිවල අන්‍යාකාරයකින් විශේෂිතව දක්වා නොමැති නම් හේතු දක්වා හෝ නොදක්වා ඔබගේ ඕනෑම ගිණුමක් පෙර දැනුම්දීමකින් යුතුව අප විසින් අත්හිටුවිම සිදු කළ හැක | • සංකුලිත ගිණුම් සඳහා වන නීතිරීති සහ කොන්දේසි (“T&Cs”) |
| **නීතිරීති සහ කොන්දේසි වෙනස් කිරීම** | • අපගේ පරිශ්‍රයන් හි, පොදු වෙබ් අඩවියෙහි හෝ අප විසින් සුදුසු යැයි තීරණය කරන ඕනෑම ආකාරයක් මගින් ඔබ වෙත දැනුම්දීම හරහා නීතිරීති සහ කොන්දේසි කලින් කලට වෙනස් කිරීම සඳහා වූ අයිතිය බැංකුව සතුවේ | |

## ඔබේ හඬ

ඔබේ අදහස් අප වෙත දැන්වීමට කැමැති නම්, කරුණාකර අප අමතන්න

තැපැල් ලිපිනය : කළමනාකරු පාරිභෝගික සේවා, පාරිභෝගික බෙදාහැරීම් සහ වත්කම් කළමනාකරණය, මධ්‍යස්ථානය, අංක 24, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01

පාරිභෝගික විසඳුම් ක්ෂණික ඇමතුම් : 94 114 511 566

විද්‍යුත් තැපැල් : customersolutions@hsbc.com.lk

වෙබ් අඩවිය : www.hsbc.lk

අප වෙත මතු කරන ඕනෑම කරුණක් ඔබ සම්පූර්ණයෙන් සතුටට පත්වන ආකාරයට විසඳීමට අප කැමති වන අතරම, ඔබට මූල්‍ය ඔම්බුඩ්ස්මන් වරයාගේ කාර්යාලය වෙත ලිපියක් ලියා ප්‍රතිකර්මයක් ඉල්ලා සිටිය හැකිය. ඔම්බුඩ්ස්මන් වරයාගේ ඇමතුම් තොරතුරු පහත දැක්වේ.

ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් වරයාගේ කාර්යාලය, අංක 01, බෙතෙස්ඩා පෙදෙස, මිලාගිරිය, කොළඹ 05.

දුරකථන : 94 11 259 5624

ෆැක්ස් : 94 11 259 5625

විද්‍යුත් තැපැල : fosril@sltnet.lk

වෙබ් අඩවිය : www.financialombudsman.lk

*සම්පූර්ණ සංකලිත ගිණුම් සඳහා වන නීතිරීති සහ කොන්දේසි සංකලිත ගිණුම් සඳහා අදාළ වේ. දැනගැනීම සඳහා පමණක් වන මූලික සැලසුම්වලට අදාළ නීතිරීතිවල සාරාංශයක් මෙම වගුවෙහි අඩංගු වන අතර, සම්පූර්ණ නීතිරීති සහ කොන්දේසි වෙනුවට එය අදාළ කරගත නොහැක. යම්කිසි අනනුකූලතාවක දී සම්පූර්ණ නීතිරීති සහ කොන්දේසි බලපැවැත්වෙනු ඇත.